# නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ ක්‍රියාවලියේ කාර්යසාධනය ඇගයීම







**වාර්තාවේ අංකය : පීඅයිපී/බී/බීඔඅයි/සීඩී/2019/14**

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| ----------- | ------------ | -------------- |
| 1 | විධායක සාරාංශය | 3 |
| 2 | හැඳින්වීම | 5 |
| 2.1 | පසුබිම | 5 |
| 2.2 | විගණනය සඳහා අධිකාරී බලය | 6 |
| 2.3 | විගණනය සඳහා මාතෘකාව තෝරාගැනිමට හේතුව | 6 |
| 2.4 | විගණන අරමුණු | 7 |
| 2.5 | ව්‍යාපෘතිය සඳහා සම්බන්ධිත ආයතන | 8 |
| 2.6 | උප අරමුණු හා නිර්නායක | 9 |
| 2.7 | විගණන ප්‍රවේශය | 10 |
| 2.8 | විගණන විෂයපථය | 11 |
| 3 | විස්තරාත්මක විගණන නිරීක්ෂණ හා නිර්දේශයන් | 12 |
| 3.1 | අපනයන සැකසුම් කලාප පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූලික සැළසුම් හා සංවිධාන ක්‍රියාවලිය | 12 |
| 3.2 | ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය | 15 |
| 3.3 | නව ආයෝජන කලාප පිහිටුවීම තුලින් වූ ආර්ථික බලපෑම | 31 |
| 4 | නිර්දේශ | 32 |

**විධායක සාරාංශය**
**-------------------**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ ජීවන තත්ත්වය නගාසිටුවීමේ ක්‍රමෝපායන් අතර විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සංවර්ධන උපායමාර්ගයක් වශයෙන් මහත් වැදගත්කමක් උසුලයි. යටිතල පහසුකම් සංවර්ධනය, රැකියා උත්පාදනය, නව තාක්ෂණික නවෝත්පාදනයන් රටතුල බිහිවීම, ගෙවුම් ශේෂ හිඟයට විසඳුමක් සැපයීම වැනි ආර්ථික වශයෙන් විශාල ප්‍රතිලාභ රැසක් මෙමඟින් ලඟාකර ගත හැක. ඒ අනුව පවත්නා අපනයන සැකසුම් කලාප වලට අමතරව නව අපනයන සැකසුම් කලාප බිහිකිරීමේ අවශ්‍යතාවය කෙරෙහි රජයේ අවධානය යොමුවිය. 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මඟින් ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා ඒ වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා අපනයන සැකසුම් කලාප ස්ථාපනය කිරීමේ බලය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැවරී ඇත. 2002 වර්ෂයෙන් පසු කිසිදු අපනයන සැකසුම් කලාපයක් ස්ථාපනය කර නොමැති තත්වයක් යටතේ දැනට ක්‍රියාත්මක වන අපනයන සැකසුම් කලාප 12 හි ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් උපායමාර්ගිකව ඉලක්ක කරගත් අංශයන් සඳහා නව අපනයන සැකසුම් කලාපයන් ස්ථාපිත කිරීම 2017 වර්ෂයේ රජයේ අයවැය යෝජනාවක් වශයෙන් ඉදිරිපත් විය. ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ රේඛීය අමාත්‍යාංශය වන සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත සැපයීමටත් ඒ අනුව අධිවේගී මාර්ග කොරිඩෝ ඔස්සේ අපනයන සැකසුම් කලාප ඉදිකිරීමටත් යෝජනා විය.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට අපනයන පදනම්කරගත් ආර්ථිකයක අවශ්‍යතාවය දැඩිව ඉස්මතුවී තිබෙන මෙවන් අවධියක නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සහ 2014 වර්ෂයේ සිට නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ යෝජනා ඉදිරිපත්වී තිබුණද එම කාර්යය සැලසුම්කල පරිදි ඉටුනොවීම විගණනය සඳහා මෙම මාතෘකාව තෝරාගැනීමට හේතුවිය.

නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සම්බන්ධයෙන් අදාල ආයතනවල කාර්යයභාරය ඇගයීම මෙම විගණනයේ අරමුණ විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සැලසුම් කල පරිදි 2020 වර්ෂය අවසන් වන විට නව අපනයන සැකසුම් කලාප 06 ක් ස්ථාපිත කිරීම යෝජනා වී තිබුණද බිංගිරිය හා මිල්ලනිය අපනයන සැකසුම් කලාප 02 පමණක් ස්ථාපිත කිරීමේ කටයුතු මේ වනවිට ආරම්භ වී ඇති බව නිරීක්ෂණය විය. මිල්ලනිය අපනයන සැකසුම් කලාපය බාහිර පුද්ගලික හවුල්කාරීත්වය තුලින් ස්ථාපිත කිරීම සඳහා යෝජනා වී තිබුණු නමුත් ඒ සඳහා ඉදිරිපත් වූ සමාගම මෙම හවුල්කාරීත්වය ඉදිරියට ගෙනයාමට කටයුතු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. නව අපනයන සැකසුම් කලාප ඉදිකිරීමේදී සිදුකරන

ලද ශක්‍යතා අධ්‍යයනවලදී අභියෝගාත්මක ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු නොවීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමට විරුද්ධව අදාල පාර්ශවකරුවන් විසින් අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මේ වනවිට රු. 2,080,533,307 ක් වැය කරන ලද මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ වැඩ කටයුතු අත්හිටුවා ඇති බව නිරීක්ෂණය විය. මිල්ලනිය හා බිංගිරිය අපනයන සැකසුම් කලාප දෙකෙහි යටිතල පහසුකම් සැපයීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා විදුලිබල මණ්ඩලය යන ආයතන සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹීමකින් තොරව රු. 2,488,251,337 ක මුදලක් ගෙවා තිබුණු බවද නිරීක්ෂණය විය. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මාර්ග ඉදිකිරීමේ කටයුතු අනුමත ප්‍රමාණ බිල්පත්‍ර රහිතව ආරම්භ කර තිබුණු අතර ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තු හා බිල්පත් නියමිත රේටයන් ඉක්මවා සකස්කර තිබුණු බවත් ඉදිකිරීම්වල ප්‍රමිතිය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බවත් නිරීක්ෂණය විය. නිසිපරිදි සැලසුම් නොකිරීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කවලට ලඟානොවීම සහ වරින් වර එම ඉලක්කයන් සංශෝධනය කිරීම, අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සැලසුම් නොකිරීම, ගිවිසුම් ඉක්මවා අතිරේඛ පිරිවැයක් දැරීමට සිදුවීම යන තත්ත්වයන් මත ව්‍යාපෘතියෙන් රජයේ අපේක්ෂා ඉටු නොවන හා අදාල පාර්ශවයන් කෙරෙහි ප්‍රතිලාභ ප්‍රේෂණය නොවන තත්ත්වයක් නිරීක්ෂණය විය.

ඒ අනුව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සියළු අංග කෙරෙහි අවධානය යොමුකරමින් නිසිපරිදි සැලසුම් කිරීම, පිරිවැය ඇස්තමේන්තු සකස්කිරීමේදී සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමුකරමින් වඩාත් නිවැරදිව ඇස්තමේන්තු සකස්කිරීම, ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනවලදී අනාගත අවදානම් සහ අභියෝග සහිත ක්ෂේත්‍රයන් කෙරෙහි නිසි අවධානය යොමුකිරීම, යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට අදාල ආයතන සමඟ විධිමත් ලිඛිත ගිවිසුම්වලට එළඹීම, යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් වෙනත් ආයතනවලින් ලබාගන්නා පිරිවැය ඇස්තමේන්තුවල නිරවද්‍යතාවය සහ ආර්ථික බව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකිරීම, යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අනුමත කරන ලද ප්‍රමාණ බිල්පත්‍ර රහිතව සහ ලිඛිත ගිවිසුම්වලට එළඹීමට ප්‍රථමව වැඩ ආරම්භ කිරීමට අවසර නොදීම , යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය අරමුදල්වල ආර්ථිකභාවය, කාර්යක්ෂමභාවය සහ ඵලදායීබව ආරක්ෂාවන පරිදි අඛණ්ඩව අධීක්ෂණය කිරීම, ගිවිසුම්ගත සේවා සැපයීමේ ගිවිසුම්වලදී අතිරේඛ පිරිවැයක් දැරීමට සිදු නොවන ආකාරයෙන් සැලසුම්කළ කාලරාමුව තුළ කාර්යයන් ඉටුකර ගැනීමට හැකිවන පරිදි වාසි සහගත කොන්දේසි ඇතුළත් කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමුකල යුතුවේ.

## 2. හැඳින්වීම

----------

### 2.1 පසුබිම

--------

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ඍජු විදේශ ආයෝජන ආකර්ෂනය කර ගැනීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන සැලසුම්වලදී හඳුනාගත් ප්‍රධානතම ක්‍රමෝපායක් වශයෙන් අතිශයින් වැදගත් වේ. 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මඟින් ඍජු විදේශ ආයෝජන ආකර්ෂනයකර ගැනීම හා ඒ සඳහා පහසුකම් සැපයීම සඳහා අපනයන සැකසුම් කලාප ස්ථාපනය කිරීමේ බලය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා ඇත. රේඛීය අමාත්‍යාංශය වශයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මෙම කාර්යය සඳහා අධීක්ෂණ කර්තව්‍යය ඉටුකරනු ලැබේ.

1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ඍජු විදේශ ආයෝජන ඉලක්ක කරගත් අපනයන සැකසුම් කලාප 12ක් බස්නාහිර, දකුණ, මධ්‍යම හා වයඹ පළාත් තුල මේ වනවිට ස්ථාපිත කොට ඇත. අපනයන සැකසුම් කලාප ස්ථාපිත කිරීමට වරින් වර යෝජනා ඉදිරිපත් වූ නමුත් 2002 වර්ෂයෙන් පසු කිසිදු අපනයන සැකසුම් කලාපයක් ස්ථාපනය කර නොමැති තත්ත්වයක් යටතේ උපායමාර්ගිකව ඉලක්ක කර ගත් අංශයන් සඳහා අපනයන සැකසුම් කලාප ඇති කිරීමට 2017 වර්ෂයේ රජයේ අයවැය මඟින් යෝජනා විය. ඒ අනුව අධිවේගී මාර්ගවල උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් අධිවේගී මාර්ග කොරිඩෝ ඔස්සේ පුද්ගලික හා රාජ්‍ය කළමනාකාරීත්වය යටතේ නිදහස් වෙළඳ කලාප පිහිටුවීම කල යුතු බවටත්, රජය විසින් ඉඩම්, විදුලිය හා ජලය සැපයීමටත්, ඒ සඳහා රු.මිලියන 1000 ක් වෙන් කිරීමටත් යෝජනා විය. එසේම, රබර් පදනම් වූ නිෂ්පාදන, ඖෂධ, රෙදිපිළි නිෂ්පාදනය, ඛණිජ, රසායන ද්‍රව්‍ය හා වාහන නිෂ්පාදනය ආදී කර්මාන්ත ඉලක්ක කර ගෙන කළුතර, රත්නපුර, පුත්තලම හා වවුනියාව දිස්ත්‍රික්ක වල නිදහස් වෙළඳ කලාප 04 ක් පිහිටුවීමටද යෝජනා විය. යෝජිත අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2017 වර්ෂයේ ජාතික අයවැයෙන් රු. මිලියන 1000 ක සහ 2018 වර්ෂයේ ජාතික අයවැය තුලින් රු. මිලියන 2,500 ක ප්‍රතිපාදන රේඛීය අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබුණු අතර 2019 වර්ෂය තුළදී රු. මිලියන 1000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

කාර්මික කලාප සඳහා ඉඩම් හඳුනාගැනීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් සහ ඉඩම් හා අනෙකුත් යටිතල පහසුකම් සැපයීමට අදාල පාර්ශවයන්ගේ සභාපතිත්වයෙන් 2017 මාර්තු 03 වන දින අරලියගහ මන්දිරයේදී පවත්වන ලද රැස්වීමේ සටහන ප්‍රකාරව පහත සඳහන් ඉඩම් කාර්මික කලාප පිහිටුවීම සඳහා හඳුනාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

| ඉඩමේ නම | මුළු ඉඩමේ විශාලත්වය (අක්කර) | ඉඩම අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| නිව් වැටල් වත්ත | 1278 | මිල්ලනිය |
| මිල්ලෑව වත්ත | 591 | හොරණ |
| සොරණ වත්ත | 668 | හොරණ |
| පෙන්රිත් වත්ත | 1597 | සීතාවක |
| එල්ස්ටන් | 1986 | සීතාවක |
| හීන්වැලියගාර වත්ත | 487 | බිංගිරිය |
| මඩුගස්අගාර වත්ත | 50 | බිංගිරිය |
| කොවුල්වැව වත්ත | 130 | උඩුබද්දාව |
| ගොරොක්ගස්අගාර වත්ත | 282 | උඩුබද්දාව |
| ජර්මන් වත්ත | 100 | උඩුබද්දාව |

මීට අමතරව වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාලිමොන්ට් වතුයායද නව අපනයන සැලසුම් කලාප ස්ථාපිත කිරීම සඳහා යොදා ගැනීම කෙරෙහි 2017 අයවැය යෝජනාව මගින් අවධානය යොමුවී තිබුණි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හා පහසුකම් සැපයීමේ ආයතනය වශයෙන්ද රේඛීය අමාත්‍යාංශය වන සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මූල්‍යයන හා අධීක්ෂණ ආයතනය වශයෙන්ද කටයුතු කරනු ලැබේ.

## 2.2 විගණනය සඳහා අධිකාරී බලය

--------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව මාගේ විධානය යටතේ මෙම කාර්යයසාධන විගණනය සිදුකරන ලදි.

## 2.3 විගණනය සඳහා මාතෘකාව තෝරාගැනීමට හේතුව

-----------------------------------------------------------

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට අපනයන පදනම්කරගත් ආර්ථිකයක අවශ්‍යතාවය දැඩිව ඉස්මතුවී ඇති තත්ත්වයක් යටතේ නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සහ 2014 වර්ෂයේ සිට නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ යෝජනා ඉදිරිපත්වී තිබුණද, එම කාර්යය සැලසුම් කල පරිදි ඉටුනොවීම විගණනය සඳහා මෙම මාතෘකාව තෝරාගැනීමට හේතුවිය.

## 2.4 විගණන අරමුණු

----------------------

නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සම්බන්ධයෙන් අදාල ආයතනවල කාර්යභාරය ඇගයීම විගණනයේ අරමුණ විය. මෙම අරමුණ කෙටියෙන් පහත සඳහන් පරිදි වේ.

(අ) නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සඳහා මූලික අධ්‍යයන සිදුකිරීමේ කාර්යභාරය ඇගයීම.

(ආ) රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සඳහා ක්‍රියාත්මක නීතිය යටතේ බලය පැවරෙන ආයතනවල කාර්යභාරය ඇගයීම.

(ඇ) අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් සැපයීමේ හා අනෙකුත් සේවා සැපයීමේ කාර්ය පැවරුණු ආයතනවල කාර්යභාරය ඇගයීම.

## 2.5 ව්‍යාපෘතිය සඳහා සම්බන්ධිත ආයතන

------------------------------------------

මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධිත ආයතන සහ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

| සම්බන්ධිත ආයතනය | කාර්යභාරය |
|---|---|
| (අ) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | ව්‍යාපෘතිය සම්බන්ධ මූලායනය සහ අධීක්ෂණය |
| (ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ , පහසුකම් සැපයීමේ සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනීමේ කාර්යභාරය ඉටුකිරීම |

| | | |
|---|---|---|
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරිය | යෝජිත අපනයන සැකසුම් කලාපවල ප්‍රවේශ මාර්ග ඉදිකිරීම |
| (ඈ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | යෝජිත අපනයන සැකසුම් කලාපවලට ජලය සැපයීමේ හා අපද්‍රව්‍ය බැහැරකිරීම් පද්ධතියට අදාල යටිතල පහසුකම් සැපයීම |
| (ඉ) | ලංකා විදුලිබල මණ්ඩලය | අපනයන සැකසුම් කලාපවලට අවශ්‍ය විදුලිබලය සැපයීමේ හා ඊට අදාල යටිතල පහසුකම් සැපයීම |
| (ඊ) | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය/පළාත් පාලන ආයතන | ජලනල එලීම හේතුවෙන් හානිවූ මාර්ග නැවත ප්‍රතිස්ථාපනය කිරීම |
| (උ) | පරිසර ඇගයීම් වාර්තා නිකුත් කරන ආයතන | නව අපනයන සැකසුම් කලාප සම්බන්ධයෙන් පරිසර බලපෑම් ඇගයීම |

## 2.6 උප අරමුණු හා නිර්ණායක

| උප විගණන අරමුණු | නිර්ණායක |
|---|---|
| (අ) ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යක්ෂමතාවය ඵලදායීතාවය හා ආර්ථිකබව ඇගයීම | ඉඩම් අත්පත් කර ගැනීමේ සැළැස්ම, 2017 සහ 2018 වර්ෂ සඳහා වූ ජාතික අයවැය යෝජනාව , කැබිනට් තීරණ, බාහිර පාර්ශවයන් සමග ඇතිකරගත් ගිවිසුම් සහ අධිකරණ නියෝග |
| (ආ) මහාමාර්ග ඉදිකිරීම් කාර්යක්ෂමතාවය ඵලදායීතාවය හා ආර්ථිකබව ඇගයීම | මහාමාර්ග ඉදිකිරීමේ සැළැස්ම |

| | |
|---|---|
| (ඇ) විදුලිය හා ජලය සැපයීමේ කාර්යක්ෂමතාවය ඵලදායීතාවය හා ආර්ථිකබව ඇගයීම | විදුලිය හා ජලය සැපයීමේ සැළැස්ම |
| (ඇ) අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමේ කාර්යක්ෂමතාවය ඵලදායීතාවය හා ආර්ථිකබව ඇගයීම | අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමේ සැළැස්ම |
| (ඉ) පරිසර බලපෑම් ඇගයීමේ හා පරිසර ප්‍රමිතීන්ට අනුගතවීමේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඇගයීම | අපජලය බැහැරකිරීමේ සැළැස්ම සහ 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ විධිවිධාන |

## 2.7 විගණන ප්‍රවේශය

-------------------

**(අ) පොත්පත් හා ලේඛන භාවිතය**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන

(i) ව්‍යාපෘතිය හා සම්බන්ධ ලිපිගොනු

(ii) ප්‍රගති වාර්තා

(iii) ගෙවීම්වලට අදාල ලිපිලේඛන හා ගිණුම්

**(ආ) අදාල පාර්ශවයන් සමඟ සම්මුඛ සාකච්ඡා**

(i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරින්

(ii) සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ නිලධාරින්

(iii) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්

(iv) බිංගිරිය අපනයන සැකසුම් කලාප කාර්යාලයේ නිලධාරීන්

(v) මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්

**(ඇ) භෞතික පරීක්ෂාවන්**

(i) මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සංවර්ධනය කිරීමේ කටයුතු

(ii) බිංගිරිය අපනයන සැකසුම් කලාපය සංවර්ධනය කිරීමේ කටයුතු

**(ඈ) විරෝධතා දැක්වූ පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගැනීම**

(i) මිල්ලනිය අපනයන සැකසුම් කලාපය පිහිටුවීම සම්බන්ධයෙන් විරෝධතා දැක්වූ පාර්ශවයන් විසින් ඉදිරිපත් කල විරෝධතාවයන්

(ii) එම විරෝධතා සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශන වාර්තා

## 2.8 විගණන විෂය පථය

-----------------------

(අ) අපගේ කාර්යසාධන විගණනය, විගණන කටයුතු පිළිබඳ ශ්‍රේෂ්ඨ ආයතනවල අන්තර්ජාතික ආයතනය (ඉන්ටෝසායි) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලැබේ. අපගේ කාර්යසාධන විගණනයේ නිරීක්ෂණයන් හා නිර්දේශයන් මත නිගමනයකට එළඹීම සඳහා සඳහන් කරන ලද අරමුණු කොතරම් දුරකට ළඟාකර ගත හැකිද, එම අරමුණු ළඟාකර ගැනීම හා සම්බන්ධ අවදානම් මොනවද යන්න තීරණය කිරීම සඳහා පදනමක් ලෙස ආයතනය ඒවායේ මෙහෙයුම් කටයුතු සහ අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳව අප විසින් අවබෝධයක් ලබාගනු ලැබේ.

(ආ) අපගේ කාර්යයන් පූර්වයෙන් සැලසුම් කොට විගණන සැලසුමට සම්බන්ධ කොට තිබේ. කාර්යසාධන විගණනය අතරතුරේදී අපගේ සොයාගැනීම් වල ප්‍රතිඵල මත මෙය වෙනස්විය හැක. ඒ අනුව අප විසින් විගණන විෂය පථය නව්‍යකරණය සහ විගණනය සඳහා පවත්නා කාල වේලාවන් සහ මානව සම්පත් මත කාර්යසාධන විගණනයේ ප්‍රමාණය නියැදි පටිපාටීන්ට සීමා කරනු ලැබේ.

(ඇ) මෙම කාර්යසාධන විගණනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය එක්ව ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණු මිල්ලනිය සහ

බිංගිරිය අපනයන සැකසුම් කලාප සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කරමින් සිදු කරන ලදී.

**3. විස්තරාත්මක විගණන නිරීක්ෂණ සහ නිර්දේශයන්**

---

**3.1 අපනයන සැකසුම් කලාප පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූලික සැලසුම් හා සංවිධාන ක්‍රියාවලිය**

---

**3.1.1 සැලසුම් කිරීම**

---

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2014 - 2016 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව 2016 වර්ෂය වන විට නව අපනයන සැකසුම් කලාප 02 ක් සහ 2017 - 2020 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව 2020 වර්ෂය වනවිට නව අපනයන සැකසුම් කලාප 06 ක් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, බිංගිරිය හා මිල්ලනිය අපනයන සැකසුම් කලාප පමණක් ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු සිදු කරගෙන යමින් පැවතුණි. ඒ අනුව නව අපනයන සැකසුම් කලාප ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සැලසුම් කරන ලද ඉලක්කයන් කරා ළඟාවීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

**3.1.2 නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සම්බන්ධයන් වූ පූර්ව අධ්‍යයනයන්**

---

නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සම්බන්ධයෙන් පහත සඳහන් ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර තිබුණි.

**(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ "ලැන්ඩ් ටීම්" නම් වූ අපනයන සැකසුම් කලාප සඳහා සුදුසු ඉඩම් හඳුනාගැනීමේ කණ්ඩායම විසින් හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික සංවර්ධන ආයතනයේ (Center for International Development) උපදෙස් අනුව සිදු කරන ලද නව කාර්මික කලාප සංවර්ධනය සඳහා විභවතාවයන් සහිත ස්ථාන හඳුනාගැනීම (Identification of Potential Sites for the Development of New Industrial Zones) නමින් වූ ශක්‍යතා අධ්‍යයනය**

---

-

මෙම අධ්‍යයන වාර්තාව 2017 ජූනි මාසයේදී නිකුත් කර තිබුණු අතර පුත්තලම, කළුතර, හොරණ, කොළඹ, කුරුණෑගල සහ මාතර යන ප්‍රදේශවල පිහිටි ඉඩම් 14 ක් සම්බන්ධයෙන්

නව කාර්මික කලාප පිහිටුවීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනය කර තිබුණි. මිල්ලනිය ප්‍රදේශයේ අක්කර 244 ක් වූ නිව් වැටල් වත්ත සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයේදී භූමි භාගය සහ සංවර්ධනය කිරීමේ හැකියාව යන භූ ලක්ෂණ , ප්‍රධාන නගරයේ සිට දුර, ප්‍රධාන පාරට ඇති දුර, ප්‍රධාන අධිවේගී මාර්ගයට ඇති දුර, වරායට/දුම්රිය මාර්ගයට/ගුවන් තොටුපලට ඇති දුර යන ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය සඳහා ප්‍රවේශය සහ විදුලිය, දුරකථන, ජලය, ප්‍රවේශ මාර්ග, බාහිර මාර්ග, බාහිර අපජල බැහැරකිරීමේ පහසුකම් වැනි යටිතල පහසුකම් යන කරුණු කෙරෙහි අවධානය යොමුකර තිබුණි. අධ්‍යයනය මඟින් මෙම ඉඩම අපනයන සැකසුම් කලාපයක් ඉදිකිරීම සඳහා සුදුසු බව තවදුරටත් නිර්දේශ කර තිබුණි.

**(ආ) අර්නස්ට් සහ යංග් ෂින්නිහොන් එල්.එල්.සී. සමාගම විසින් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයනය**

---

2018 මැයි මාසයේදී නිකුත් කරන ලද මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව මිල්ලනිය අපනයන සැකසුම් කලාපය ඉදිකිරීමට යෝජිත ප්‍රදේශය රබර් වගාවක් සහිත ඉඩමක් බවත්, දක්ෂිණ අධිවේගී මාර්ගයට ආසන්න බවත්, ගංවතුර කළමනාකරණය කිරීම අවශ්‍ය වන බවත්, උපයෝගී පහසුකම් මේ වනවිට රජය විසින් සැපයීමට සූදානම් බව සහ වගා පවුල් 50 ක් යෝජිත ඉඩමෙහි පදිංචි වී සිටින බවත් සඳහන් කර ඇති අතර මෙම ඉඩම කාර්මික කලාපයක් වශයෙන් සංවර්ධනය කල හැකි එනම් “A” ශ්‍රේණියේ වැඩබිමක් ලෙසත් ශ්‍රේණිගත කර තිබුණි.

කෙසේවුවද, රජයේ රබර් ප්‍රතිපත්තිය යටතේ වසර 53 ක කාලයක් සඳහා වූ බදු ගිවිසුමක් යටතේ දැනට පවත්වාගෙන යන රබර් වගාවක් සහිත වූ , වගාවට සම්බන්ධ ශ්‍රමික පවුල් 50 ක් පදිංචි වී සිටින මෙම ඉඩම කාර්යක්ෂමව අත්පත් කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තා දෙක මඟින්ම අවධානය යොමු කර තිබුණු බව නිරීක්ෂණය නොවීය. කෙසේ වුවද, බදු කරු වූ හොරණ වැවිලි සමාගම විසින් අදාල ඉඩම අත්පත්කර ගැනීමට විරුද්ධව ගත් අධිකරණමය ක්‍රියාමාර්ග හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවීමට සිදුවී තිබුණි.

මේ හේතුවෙන් ඉදිරියේදී ස්ථාපිත කිරීමට යෝජිත අපනයන සැකසුම් කලාප සම්බන්ධයෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ දී මුහුණපෑමට සිදුවන ගැටළු සහ අවධානම් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකළ යුතු තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

### 3.1.3 අපනයන සැකසුම් කලාප ස්ථාපිත කිරීමේ යෝජනාව හා අනුමැතිය

---------------------------------------------------------------------------

(අ) 2017 වර්ෂයේ අයවැය යෝජනාව අනුව කළුතර ප්‍රදේශයේ මිල්ලනිය අපනයන සැකසුම් කලාපයක් ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රදේශයක් වශයෙන් යෝජනා විය. ඒ අනුව 2017 අගෝස්තු 21 දිනැති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ අනුමැතිය සහිතව 2017 දෙසැම්බර් 15 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව 2018 ජනවාරි මස 10 වෙනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු බාහිර/පෞද්ගලික ආයතන සමඟ සහයෝගිතාවයෙන් අපනයන සැකසුම් කලාප/කාර්මික උද්‍යාන ස්ථාපනය කිරීම සඳහා වූ සංකල්පමය ආකෘතිය ප්‍රකාරව අපනයන සැකසුම් කලාප/කාර්මික කලාප බවට සංවර්ධනය කල හැකි අධිවේගී මාර්ග, වරායන් සහ ගුවන් තොටුපළ ආශ්‍රිතව පිහිටි සාපේක්ෂව පහසුවෙන් අත්පත් කර ගත හැකි සුදුසු ඉඩම් හා ස්ථාන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් හඳුනාගත යුතු විය.

(ආ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඒකාබද්ධ හවුල්කාරීත්වය මඟින් කලාපය/උද්‍යානය සංවර්ධනය කිරීම, ජාතික අයවැය මගින් වෙන්කර ඇති ප්‍රතිපාදන මගින් කලාපයෙන්/උද්‍යානයෙන් පිටත පිහිටි යටිතල පහසුකම් සැපයීම සහ මාර්ග ජාලය සහ උපයෝගිතා සේවාවන් සැපයීම රජය විසින් සිදු කළ යුතු අතර නියාමනයන් සහ පහසුකම් සැපයීමේ වගකීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරන ලදි. කලාපය ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලය සම්බන්ධයෙන් ඒකාබද්ධ හවුල්කාරීත්වය සමග නීත්‍යානුකූල ගිවිසුමකට ආයෝජන මණ්ඩලය ඇතුලත් විය යුතු විය. ඒ අනුව පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කරන උද්‍යාන/කලාප සංවර්ධනය කිරීමේ යෙදී සිටින තායිලන්තයේ සමාගමක් වන සී/ස රෝජනා ඉන්ඩස්ට්‍රියල් පාර්ක් සමාගම විසින් එකගතාවය පලකර තිබුණු අතර කලාප කළමනාකරු හෝ වෙනත් සේවා සපයන්නෙකු ලෙස සී/ස රෝජනා ඉන්ඩස්ට්‍රියල් පාර්ක් සමාගම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ඒකාබද්ධ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපියක් (Letter of Intent) 2017 අගෝස්තු 21 දින අත්සන් කොට තිබුණි. කෙසේ වෙතත් අපේක්ෂිත කාලය තුළ ඉඩම නිදහස් නොවීමත්, අපනයන සැකසුම් කලාපය දක්වා වන යටිතල පහසුකම් ඒ වන විට සූදානම්ව නොපැවතීමත් හේතුවෙන් මෙම එකගතාවය ඉදිරියට ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීම පිළිබඳ යෝජනාව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව විසින් 2017 නොවැම්බර් 08 දින පැවති කමිටු රැස්වීමේදී අනුමත කරන ලද අතර ඒ සඳහා 2017 දෙසැම්බර් 13 දින අමාත්‍ය

මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මේ යටතේ බිංගිරිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ජර්මන් වත්තෙන් අක්කර 164 ක් පළමු අදියර යටතේ සහ ගොරක ගස් අගාරවත්තෙන් අක්කර 283 ක් දෙවන අදියර යටතේ අපනයන සැකසුම් කලාපය පිහිටුවීම සඳහා අත්පත්කර ගැනීමට තීරණය කර තිබුණි.

## 3.2 ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය

----------------------------

මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ කටයුතු සඳහා 2017 වර්ෂයේ අයවැය යෝජනාව යටතේ රු.මිලියන 1000 ක මුදලක් වෙන් කරන ලද අතර එය රේඛීය අමාත්‍යාංශය වන සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණි. යටිතල පහසුකම් වෙනුවෙන් 2017 සැප්තැම්බර් මස සිට ගෙවීම් කිරීම ආරම්භ කර තිබුණද මෙම සමස්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් ව්‍යාපෘති සැලැස්මක් (Project Plan) හා ගෙවීම් සැලැස්මක් (Payment Plan) සකස් කර නොතිබුණි. කෙසේවුවද, ඊට වසරකට පසුව එනම් 2018 සැප්තැම්බර් 04 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව මිල්ලනිය අපනයන සැකසුම් කලාපයට අදාල පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ඉඩමේ ප්‍රමාණය (අදියර I හා II) | අක්කර 400 |
| කාර්මික භූමි ප්‍රමාණය | අක්කර 240 |
| යටිතල පහසුකම් (බාහිර) සඳහා වන වියදම් පිරිවැය | රු.මිලියන 8,366 |
| අභ්‍යන්තර යටිතල පහසුකම් පිරිවැය | රු. මිලියන 2,745 |
| පෙර ගෙවුම් බදු වාරිකය | ඇ.ඩො.60,000 |
| බදු කුලිය -අක්කරයට | ඇ.ඩො. 4,660 |
| තැන්පතු අනුපාතිකය | සියයට 8.75 |
| වට්ටම් සාධකය (මහ බැංකුව විසින් ගණනය කරන ලද අනුපාතිකය) | සියයට 9 |
| ආපසු ගෙවීමේ කාලය | 14 වසරකට පසු |

අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් සැපයීම පිළිබඳ පිරිවැය විස්තර පහත සඳහන් පරිදි වේ.

| වැය විස්තරය | 2017 හා 2018 සඳහා ගෙවන ලද මුදල (රු.මිලියන) | 2018 (රු.මිලියන) | 2019 (රු.මිලියන) | 2020 (රු.මිලියන) | එකතුව (රු.මිලියන) |
|---|---|---|---|---|---|
| අන්තර් හුවමාරුව හා ප්‍රවේශ මාර්ග - මාර්ග සංවර්ධන අධිකාරිය | 80 | 900 | 2,170 | 4,338 | 7488 |
| ජල සැපයුම - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 298 | 545 | 307 | 100 | 1250 |
| විදුලි සැපයුම - ලංකා විදුලිබල මණ්ඩලය | 102 | 832 | 896 | 1,190 | 3,020 |
| ඉඩම් අත්පත්කර ගැනීම - ප්‍රාදේශීය ලේකම්,මිල්ලනිය | 91 | 275 | - | 1,000 | 1,366 |
| අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | - | - | 50 | 200 | 250 |
| ජලනල එලීම හේතුවෙන් මාර්ග නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තු - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය / පළාත් පාලන ආයතන | 53 | 10 | 27 | 10 | 100 |
| **එකතුව** | **624** | **2,562** | **3,450** | **6,838** | **13,474** |

2018 ඔක්තෝබර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීමේදී ඉඩම් අත්පත් කර ගැනීම, විදුලිය සැපයීම, ජලය සැපයීම සහ ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම වැනි යටිතල පහසුකම් සැපයීම පිළිබඳ විස්තරාත්මක පිරිවැය විශ්ලේෂණය පහත සඳහන් පරිදි වේ.

| **මූලික වැඩ** | **2018** රු.මිලියන | **2019** රු.මිලියන | **2020** රු.මිලියන | **එකතුව** රු.මිලියන |
|---|---|---|---|---|
| **ඉඩම් අත්පත්කර ගැනීම** | 105 | 175 | - | 280 |
| **ප්‍රවේශ මාර්ග ඉදිකිරීම** | | | | |
| ජේ.ආර්.හන්දිය සිට හෙට්ටියාකොටුව හන්දිය දක්වා | 298 | - | - | 298 |
| ජේ.ආර්.හන්දිය සිට තුන්තොට දක්වා | - | 220 | - | 220 |
| හෙට්ටියාකොටුව හන්දිය සිට හලාවත වැවිලි සමාගම් මණ්ඩලය දක්වා | - | - | 902 | 902 |
| **ජල සම්පාදනය** | | | | |
| හලාවත ජල සම්පාදන ව්‍යාපෘතියෙන් 1000 $m^3$ක ආරම්භක ජල සැපයුම | 79.9 | 319 | - | 403 |
| **විදුලිබල සැපයුම** | | | | |
| මාදම්පේ විදුලි උපපොලෙන් 2MVA මූලික විදුලි සැපයුම | 7.46 | - | - | 7.46 |
| 8MVA ස්ථිර විදුලි සැපයුම | - | - | 150 | 150 |
| **විවිධ** | | | | |
| සමමිතික මැනුම් | 1.7 | - | - | 1.7 |
| පාංශු විමර්ශන කටයුතු | 3.58 | - | - | 3.58 |
| | **500** | **714** | **1052** | **2266** |

අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

### 3.2.1 ඉඩම් අත්පත්කර ගැනීම

---------------------------

2017 අගෝස්තු 16 දින පැවති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් මිල්ලනිය අපනයන සැකසුම් කලාපය පිහිටුවීම සඳහා නිව් වැටල් වත්තේ අදියර I වශයෙන් හඳුනාගෙන ඇති අක්කර 244 කින් යුතු ඉඩම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත කඩිනමින් පැවරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට නියෝග කර තිබුණි. අත්පත් කර ගැනීමට නියමිත මෙම ඉඩම අයත්වන අක්කර 2228 කින් යුතු මිල්ලනිය නිව් වැටල් වතුයාය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වන අතර රාජ්‍ය වැවිලි සංස්ථාවට බදු දෙනු ලදුව ඔවුන් විසින් 1995 අවුරුද්දේදී හොරණ වැවිලි සමාගමට උප බදු යටතේ අවුරුදු 53 ක කාල සීමාවකට ලබාදී තිබේ.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව පොදු අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන නිවේදනය නිකුත් කරන ලද අතර පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ කරන ලද 2018 ජූලි 25 දිනැති දැන්වීමට අනුව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත පාර්ශවයන් 10 ක් විසින් විරෝධතා ඉදිරිපත් කර තිබුණි.

පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද විමර්ශන නිලධාරියෙකු විසින් 2018 ඔක්තෝබර් 04 දින මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සිදු කරන ලද විමර්ශනය අනුව මෙහි ප්‍රධානතම විරෝධතාකරු වන හොරණ වැවිලි පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා අතර ප්‍රධාන විරෝධතා පහත සඳහන් පරිදි වේ.

(අ) සමාගමට අවුරුදු 53 ක පරිහරණය සඳහා ඉඩම ලබාදීමට ගත් තීරණයට මෙම පවරා ගැනීම විරුද්ධ බව

(ආ) රජයේ ප්‍රතිපත්තිය මත මෙම වත්ත පෞද්ගලික අංශයට බදු දී ඇත්තේ එවකට පාඩු ලබමින් තිබූ බැවින් මෙන්ම එම වත්ත ලාභ ලැබීමේ තත්ත්වයට පත් කිරීමට මෙන්ම රැකියා අවස්ථා ආදී අනෙකුත් ආර්ථික ප්‍රතිලාභ ලබාදීමට සමාගමට හැකිවූ බව,

(ඇ) සමාගම විසින් මෙම වත්ත සංවර්ධනය සඳහා රු. මිලියන 500 ක් ආයෝජනය කර ඇති බව

(ඈ) මෙම වත්ත මගින් රැකී රක්ෂා 300 ක් සපයා ඇති බව සහ සම්පූර්ණ වශයෙන් පුද්ගලයින් 2,320 කට මෙම වත්තෙහි ජීවත්වීමට පහසුකම් සලසා ඇති බව

(ඉ) මෙම වත්ත ලබාගත් අවස්ථාවේ සිට මේ දක්වා රබර් ගස් 160,000 ක් නැවත වගාකර ඇති බව

(ඊ) මෙම වත්තෙන් ලැබෙන වාර්ෂික ආදායම සාමාන්‍යයක් වශයෙන් රු. මිලියන 83 ක් වන බව

(උ) ක්‍රේප් රබර් නිපදවීම සඳහා රුපියල් මිලියන 45.43 ක් වැය කොට කර්මාන්ත ශාලාව නවීකරණය කළ බව සහ

(ඌ) මෙම වත්තේ රුපියල් මිලියන 94.72 ක් වැය කොට ඔයිල් පාම් වගා කොට ඇති අතර එම වගාව දැනට ඵල දරන බව

(එ) මෙම අත්පත් කර ගැනීමට නියමිත ඉඩම් කොටස ඉහල අස්වැන්නක් සහිත ඉඩමක් බවත් මෙම වත්ත පිහිටා ඇති ප්‍රදේශය රබර් වගාව සඳහා ඉතා උචිත ප්‍රදේශයක් වන අතර උසස් තත්ත්වයේ ක්‍රේප් රබර් මෙහි නිපයනු ලබන අතර ඒ සඳහා වෙන්දේසිවල ඉහල මිලක් ලබා ගත හැකි බව

කෙසේ වුවද, ඉහත කරුණු පදනම්ව හොරණ වැවිලි පුද්ගලික සමාගම විසින් 2019 මැයි 07 වන දින අයදුම්පත්‍ර අංක CA (Writ) 115/2019 යටතේ මිල්ලනිය අපනයන සැකසුම් කලාපය පිහිටුවීම සඳහා යෝජිත ඉඩම රජය විසින් අත්පත් කරගැනීමට එරෙහිව අභියාචනාධිකරණය වෙත මෝසමක් ගොනු කරන ලද අතර 2019 සැප්තැම්බර් 19 දින අධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් නැවැත්වීමේ ආඥාවක් (Stay Order) නිකුත් කර තිබුණු අතර එය 2021 ජනවාරි 21 දින දක්වා දීර්ඝ කිරීමට නියෝග කර ඇත.

2017 නොවැම්බර් 02 දිනැති රජයේ තක්සේරුකරුට අනුව අත්පත් කර ගැනීමට නියමිත ඉඩම් ප්‍රමාණයෙහි වටිනාකම රු.366,000,000 ක් වන අතර ඉන් සියයට 25ක් එනම් රු.91,500,000 ක

මුදලක් ඉඩම් අත්පත් කර ගැනීමේ තැන්පතුවක් වශයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් වෙත 2017 නොවැම්බර් මස 29 වන දින ගෙවා තිබුණි.

ඉඩම් අත්පත්කර ගැනීමේ කාර්යය 2018 වර්ෂය වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් ඉහත වැව්ලි සමාගම විසින් ගනු ලැබූ අධිකරණමය ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 එම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන්කර ගැනීමට නොහැකිවී තිබුණි. කෙසේ වෙතත් ඉඩම් අත්පත් කර ගැනීමට පෙර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 1,988,918,307 ක මුදලක් අමාත්‍යාංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය යන ආයතන වලට ගෙවා තිබුණි.

### 3.2.2 මහාමාර්ග ඉදිකිරීම

----------------------

(අ) මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සඳහා ප්‍රවේශ මාර්ග වශයෙන් පැල්පොල අන්තර් හුවමාරුව සහ ඊට අදාල ප්‍රවේශ මාර්ග සහ වගවත්ත අපනයන සැකසුම් කලාපය සඳහා ප්‍රවේශ මාර්ගයද ඉදිකිරීම සඳහා රු.මිලියන 3900ක ඇස්තමේන්තුගත වියදමක් දැරීමටත් එම කටයුතු 2020 වර්ෂය වනවිට අවසන් කිරීමටත් යෝජිතව තිබුණි. මේ සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 80ක් සහ 2019 වර්ෂය තුල රු.මිලියන 125ක් වශයෙන් රු.මිලියන 205ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. 2019 නොවැම්බර් 07 වන දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවට අනුව පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීම සහ ප්‍රවේශ මාර්ග සම්බන්ධ ඉදිකිරීම් කිසිවක් ආරම්භ වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

හොරණ වැව්ලි සමාගම විසින් ගෙන ඇති අධිකරණමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් 2020 ජූලි මස දක්වා වැඩ නැවත්වීමේ ආඥාවක් (stay order) ලබාදීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු නවත්වන ලෙස සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත 2019 ඔක්තෝබර් 16 දින දැනුම්දී තිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2019 වර්ෂය අවසන් වනවිට පැල්පොල අන්තර් හුවමාරුව සහ ප්‍රවේශ මාර්ග ඉදිකිරීමේ කටයුතු වලින් සියයට 60 ක් අවසන් කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරියේ තොරතුරුවලට අනුව 2020 ජූලි 10 දිනට ව්‍යාපෘතියට අදාල මාර්ග සංවර්ධන කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| කාර්යය | ප්‍රගතිය (%) |
| --- | --- |
| පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීම | 19 |
| මිල්ලනිය සිට පැල්පොල දක්වා වූ මංතීරු 4කින් යුතු ප්‍රවේශ මාර්ග | 2 |
| හොරණ වගවත්ත පාර | 37 |
| සමස්ත ප්‍රගතිය | 19 |

(ආ) බිංගිරිය අපනයන සැකසුම් කලාපය පිහිටුවීමට අදාල විස්තරාත්මක පිරිවැය විශ්ලේෂණය අනුව ප්‍රවේශ මාර්ග 03ක් හඳුනාගෙන තිබුණු අතර එම මාර්ග ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 298ක්, 2019 වර්ෂයේදී රු.මිලියන 220ක් සහ 2020 වර්ෂය සඳහා රු.මිලියන 902ක් වැය වන බව ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී ජේ.ආර්.හන්දිය සිට හෙට්ටියාකොටුව හන්දිය දක්වා ප්‍රවේශ මාර්ගය ඉදිකර අවසන් කල යුතු වූ අතර 2019 වර්ෂය තුලදී තුන්තොට සිට ජේ.ආර්.හන්දිය දක්වා වූ මාර්ගය ඉදිකර අවසන් කල යුතු විය. ඒ අනුව අමාත්‍යාංශය විසින් ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා 2018 සහ 2019 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 350ක් ගෙවා තිබුණු අතර ඉන් රු.මිලියන 100ක් මූලික සංවර්ධන කටයුතු වෙනුවෙන්ද, රු.මිලියන 200ක් තුන්තොට සිට ජේ.ආර්.හන්දිය දක්වා වූ මාර්ගය වෙනුවෙන්ද, රු.මිලියන 50ක් ජේ.ආර්.හන්දිය සිට හෙට්ටියාකොටුව දක්වා මාර්ගය වෙනුවෙන්ද වැයකර තිබුණි.

සැලසුම අනුව 2018 වර්ෂයේදී ජේ.ආර්.හන්දිය සිට හෙට්ටියාකොටුව හන්දිය දක්වා ප්‍රවේශ මාර්ගය ඉදිකර අවසන් කල යුතු වුවද අදාල ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත්කල ප්‍රගති වාර්තාව අනුව 2020 ජූලි 15 දිනට එහි ප්‍රගතිය සියයට 58 ක් විය. එසේම 2019 වර්ෂය තුලදී ඉදිකර අවසන් කල යුතු තුන්තොට සිට ජේ.ආර්.හන්දිය දක්වාවූ මාර්ගය ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 7.6 ක් විය.

මේ සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 26 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මාර්ග ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ප්‍රමාණ බිල් පත්‍රය 2019 නොවැම්බර් 26 වන දින වන විටත් අනුමත වී නොතිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු වරයාගේ ලිඛිත ප්‍රකාශය අනුව 2019 අප්‍රේල් මස 25 වන දින සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යවරයා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදුන් වාචික උපදෙස් මත තුන්තොට

ජේ.ආර්.හන්දිය දක්වා මාර්ගයේ කටයුතු ආරම්භ කර තිබුණි. කෙසේ වුවද ,2020 ජුනි 30 දින වන විටද ප්‍රමාණ බිල් පත්‍රය අනුමත වී නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට වගකිවයුතු අධ්‍යක්ෂකවරයෙකු පත් කර තිබුණු අතර, ඔහු විසින් ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සැපයීම සම්බන්ධ කාර්යසාධනය සතිපතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු විය. එසේ වුවද, අධ්‍යක්ෂවරයා විසින් අදාළ කාර්යසාධනය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියෙන් තොරතුරු කැඳවීම කර තිබුණද ඒ සම්බන්ධයෙන් අධිකාරිය ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් අදාළ කාර්යසාධන වාර්තා නිකුත් වී නොතිබුණු බැවින්, ඒ සම්බන්ධ තොරතුරු විගණනයට අනාවරණය කරගත නොහැකි විය.

(iii) සම්පූර්ණ ඉදිකිරීම් අවසන් වන විට රු. මිලියන 30 කට ආසන්න වියදමක් දැරීම සඳහා ඇස්තමේන්තුගත කර තිබුණු ජේ.ආර්.හන්දිය සහ වතුවත්ත අතර මාර්ගයෙහි 24 +786 අංක දරන බෝක්කුවේ ඉදිකිරීම් කටයුතු සියයට 50 ක් පමණ මේ වන විට අවසන් කර තිබුණු අතර රු. 1,437,242 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් මෙම බෝක්කුව නියමිත උසට වඩා උසකින් ඉදිකිරීම හේතුවෙන් කුඹුරුවල ජලය ඒ තුළින් බැස නොයන බව නිරීක්ෂණය විය. මෙයට පිළියමක් වශයෙන් දුම්මලසූරිය ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් කළ ඉල්ලීම මත බෝක්කුවට පහළින් හියුම් පයිප්පයක් යොදවා තිබුණු අතර නිසි පරිදි සැලසුම් නොකිරීම හා ඉදිකිරීම් අධීක්ෂණයෙහි පවතින දුර්වලතාවයන් මේ සඳහා හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iv) ජේ.ආර්.හන්දියේ සිට හෙට්ටියාකොටුව දක්වා වූ මාර්ගයට අදාළව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සකස් කළ ප්‍රමාණ බිල් පත්‍රයට අනුව ගල්ඇතුරුම (Aggregate Base Code-ABC)මි.මී.250 ක ඝනකමකින් යුක්තවිය යුතු වුවද කි.මී.1+000 සහ කි.මී.0+950 යන ස්ථානවල එම ඇතුරුම පිළිවෙලින් මි.මී.190 හා මි.මී. 200 ක ඝනකමකින් යුතු බව නිරීක්ෂණය විය.

(v) වයඹ පළාතට අයත් තුන්තොට සිට ජේ.ආර්.හන්දිය දක්වාත්, ජේ.ආර්.හන්දියේ සිට හෙට්ටියාකොටුව හන්දිය දක්වාත් වූ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස්කල ඇස්තමේන්තුව සඳහා බස්නාහිර පළාත් රේටයන් යොදාගෙන තිබුණු අතර කිලෝ මීටර 60 ක දුරක සිට පස් ප්‍රවාහනය කිරීම සඳහා මිල ගණන් ඇතුලත් කර තිබුණි. මෙතරම් දුරක සිට පස් ප්‍රවාහනය ප්‍රායෝගික නොවීම හා ආර්ථිකමය නොවීම හේතුවෙන් කිලෝ මීටර 10ක දුරක සිට පස් ප්‍රවාහනය කිරීමේදී දැරියයුතු පිරිවැය සලකමින් සහ වයඹ පළාතට අදාල රේටයන් යොදා ගනිමින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කල ඉහත සඳහන් ඇස්තමේන්තුව අතර රු.1,327,670,506ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | මාර්ග සංවර්ධන අධිකාරියට අනුව ඇස්තමේන්තුගත වියදම | ව්‍යාපෘති අධ්‍යක්ෂකට අනුව ඇස්තමේන්තුගත වියදම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| තුන්තොට සිට JR හන්දිය 0+000 – 1+200 km | 474,335,503 | 223,926,059 | 250,409,444 |
| JR හන්දිය සිට හෙට්ටියා කොටුව 0+000 – 4+850 km | 2,081,674,568 | 1,004,413,506 | 1,077,261,062 |
| | **2,556,010,071** | **1,228,339,565** | **1,327,670,506** |

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් 2020 ජුනි 30 දින වනවිටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හෝ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එකගතාවයකට පැමිණ නොතිබුණි.

(vi) මෙම ව්‍යාපෘතියට අදාලව සිදුකරන ලද ඉදිකිරීම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 අගෝස්තු 05, 2019 ඔක්තෝබර් 03 සහ 2019 ඔක්තෝබර් 11 යන දිනයන්හීදී පිළිවෙලින් රු.203,875,732, රු.45,019,629 හා රු.16,597,780ක් වටිනා අතුරු ගෙවීම් සහතික (Interim Payment Certificate) 03ක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් වයඹ පළාතේ සිදුකරන මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ඉහත සඳහන් අතුරු ගෙවීම් සහතිකවල සඳහන් රේටයන් බස්නාහිර පළාතට අදාල රේටයන් වීම හේතුවෙන් අපනයන සැකසුම් කලාපයේ කටයුතු වෙනුවෙන් පත්කර ඇති අධ්‍යක්ෂවරයා විසින් එම ගෙවීම් සහතික අනුමත කර නොතිබුණි. එසේම ඉහත සඳහන් පරිදි අනුමත කරන ලද ප්‍රමාණ බිල්පත්‍ර සහ ලිඛිත ගිවිසුම් රහිතව ඊට අදාල බිල්පත් අනුමත කල නොහැකි බව එකී අධ්‍යක්ෂවරයා විසින් 2019 නොවැම්බර් 08 වන දින සංවර්ධන

උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාට පිටපතක් සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වෙත දන්වා තිබුණි. එම අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් දක්වා ඇති පරිදි මාර්ග සංවර්ධන අධිකාරිය සකස්කල අතුරු ගෙවීම් සහතිකවල සඳහන් ඉදිකිරීම්වල වටිනාකම සහ අදාල නිවැරදි රේටයන් භාවිතකර එම ඉදිකිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා සිදුකල ගණනය කිරීම් අතර රු.156,513,806 ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **මාර්ග සංවර්ධන අධිකාරිය සකස් කළ අතුරු ගෙවීම් සහතික අනුව වටිනාකම (බදු රහිත)** | **ව්‍යාපෘතිය භාර අධ්‍යක්ෂවරයාගේ ගණනය කිරීම් අනුව වටිනාකම** | **වෙනස** |
|---|---|---|---|
| | **රු.** | **රු.** | **රු.** |
| IPC 01 | 193,041,756 | 69,464,533 | 123,577,223 |
| IPC 02 | 38,464,897 | 14,913,907 | 23,550,990 |
| IPC 03 | 14,181,190 | 4,795,597 | 9,385,593 |
| | 245,687,843 | 89,173,037 | 156,513,806 |

### 3.2.3 ජලසම්පාදනය

(අ) මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සඳහා ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය මඟින් ජල සැපයීමේ කටයුතු 2020 වනවිට අවසන් කිරීමට සැලසුම්කර තිබූ අතර ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 1250 ක් විය. කෙසේ වෙතත් ඉඩම් අත්පත් කරගැනීමේ ගැටළු හේතුවෙන් ඉදිරි කටයුතු අත්හිටුවන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් 2019 පෙබරවාරි 25 වන දින ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වෙත දැනුම් දී තිබුණි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2019 වර්ෂය අවසන් වනවිට ජල සැපයුමෙන් සියයට 50 ක ප්‍රගතියක් අත්පත් කරගත යුතුව තිබුණි. ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ වාර්තා වලට අනුව 500m$^{3}$/day ජල සැපයුම් කටයුතු අවසන්කර ඇති අතර 10,000m$^{3}$/day ජල සැපයුම් කටයුතු රේඛීය අමාත්‍යාංශයේ දැනුම්දීම මත අත්හිටුවා ඇති

බැවින් ගෙවන ලද සම්පූර්ණ මුදල වූ රු.මිලියන 323.36 ක් වූ මුදලින් රු.මිලියන 163.75ක මුදලක් බිංගිරිය අපනයන සැකසුම් කලාපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙත මාරුකර තිබුණි.

(ආ) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ ජල සම්පාදන කටයුතු වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රු.මිලියන 79.9ක්ද, 2019 වර්ෂය සඳහා රු.මිලියන 319ක්ද ඇස්තමේන්තු කර තිබුණි. විගණිත දිනය වනවිට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත මූලික වැඩ, මිනුම් කටයුතු සහ යෝජිත ජලනල පද්ධතිය දීර්ඝ කිරීම වෙනුවෙන් රු.මිලියන 137.1ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2019 වර්ෂය අවසන් වනවිට මෙම ව්‍යාපෘතිය අවසන් විය යුතු වුවද මේ සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ ජල සැපයුමේ ප්‍රගතියට අදාලව 2020 ජූනි 30 දින නිකුත් කර තිබූ වාර්තාවට අනුව පාංශු විමර්ශන කටයුතු සහ මැනුම් කටයුතු සියයට 100 ක් අවසන් කර තිබුණු අතර යෝජිත ජලනල එලීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 75 ක් ක් විය. එසේම 225 $m^3$ ක ධාරිතාවයකින් යුතු එක්රැස් කිරීමේ ටැංකි 2ක්, පොම්පාගාරයක් සහ රසායනාගාරයක් ඉදිකිරීම සම්බන්ධයෙන් සියයට 75 ක භෞතික ප්‍රගතියක් අත්පත්කරගෙන තිබුණු අතර අදාල කාර්මික සහ විදුලි උපකරණ සැපයීම හා සවිකිරීමේ ප්‍රගතිය සියයට 10 ක් විය.

### 3.2.4 විදුලිය සැපයුම

----------------

මිල්ලනිය අපනයන සැකසුම් කලාපයට අමතරව වගවත්ත අපනයන සැකසුම් කලාපයටද විදුලිය සැපයීමේ අරමුණින් වගවත්ත අපනයන සැකසුම් කලාපයට අයත් භූමියෙහි විදුලි උප පොලක් සහිතව විදුලිය සැපයීමේ කටයුතු සැලසුම්කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 2400 ක ඇස්තමේන්තු කර තිබුණි. විදුලිය සැපයීමේ කටයුතු 2020 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද විදුලිබල මණ්ඩලයේ 2019 නොවැම්බර් 15 දිනට ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 27 වනවිට අවසන් කිරීමට සැලසුම්කර තිබුණි. එම ප්‍රගති වාර්තාව අනුව 2019 නොවැම්බර් 15 දින වනවිට සමස්ත ප්‍රගතිය සියයට 31 ක් විය. මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු.1,407,762,550ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් පවතින තත්වය හමුවේ තාවකාලික විදුලි සැපයීම අත්හිටුවන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් 2019 පෙබරවාරි 07 දින ලංකා විදුලිබල මණ්ඩලය වෙත දන්වා තිබුණි. කෙසේ වුවද , 2020 ජුනි 30 දිනැති ප්‍රගති වාර්තාවට අනුව මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් වී නොතිබුණි.

### 3.2.5 ජලනල එළීම හේතුවෙන් මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ ගාස්තු

මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ ජලනල එළීම හේතුවෙන් මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2020 වර්ෂය වනවිට අවසන් කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර ඇස්තමේන්තුගත වියදම රු.100,000,000 ක් විය. මේ සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින වනවිට බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රු.52,792,600ක මුදලක් ගෙවා තිබුණි. මෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 18 දින බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය විසින් මෙම මාර්ගවල වැඩ අවසන්කර අධිකාරිය වෙත භාරදී නොතිබුණි. ඒ අනුව මෙම කාර්යය සම්බන්ධයෙන් මුදල් ගෙවා තිබුණද කිසිදු කාර්යයක් ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2.6 අපජලය බැහැර කිරීමේ පද්ධතිය

මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ අපජලය බැහැර කිරීමේ කාර්යය 2019 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂයේ දී නිමකිරීමට සැලසුම් කර තිබුණු අතර, ඒ වෙනුවෙන් වියදම රු.මිලියන 250ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවත් අධිකරණ නියෝග හමුවේ ව්‍යාපෘතිය අත්හිටුවා ඇති බැවින් මේ සම්බන්ධ කිසිදු ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය.

### 3.2.7 අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සැපයීම සඳහා ගිවිසුම්වලට එළඹීම

මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සම්බන්ධයෙන් යටිතල පහසුකම් සැපයීම සඳහා සේවා ලබාගන්නා ලද ආයතන වෙත 2017, 2018 සහ 2019 වර්ෂවලදී සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් පහත සඳහන් පරිදි ගෙවීම් කර තිබුණි.

| **ආයතනය** | **ගෙවූ මුළු මුදල රු.** |
|---|---:|
| මාර්ග සංවර්ධන අධිකාරිය | 205,000,000 |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 52,792,600 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 323,363,157 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 1,407,762,550 |
| එකතුව | **1,988,918,307** |

බිංගිරිය අපනයන සැකසුම් කලාපය සම්බන්ධයෙන් යටිතල පහසුකම් සැපයීම සඳහා සේවා සපයන ලද ආයතන වෙත 2018 සහ 2019 වර්ෂවලදී සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් පහත සඳහන් පරිදි ගෙවීම් කර තිබුණි.

| ආයතනය | ගෙවූ මුළු මුදල<br>රු. |
| --- | --- |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 350,000,000 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 137,100,000 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 12,233,030 |
| එකතුව | **499,333,030** |

ඒ අනුව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් යටිතල පහසුකම් සැපයීම සඳහා සේවා සපයන ආයතන වෙත රු. 2,488,251,337 ක මුදලක් ලිඛිත ගිවිසුම් වලට ඇතුළත්වීමකින් තොරව ගෙවා තිබුණු බව නිරීක්ෂණය වූ අතර, 2020 ජුනි 30 දින වන විටත් එකී ගිවිසුම්වලට එළඹීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

### 3.2.8 පරිසර බලපෑම ඇගයීම

(අ) මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සඳහා 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ IV-C වගන්තිය ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වන අතර, ඒ සඳහා පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කල යුතුය. අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත අයදුම්පත භාරදීමේදී රු. 500,000 ක පරිපාලනමය ගාස්තුවක් ගෙවා තිබුණි. පාරිසරික බලපෑම් ඇගයීමේ කටයුතු, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු අනුමැතිය යටතේ කාර්මික තාක්ෂණික ආයතනය වෙත පවරා තිබුණු අතර, ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් රු. 1,185,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් 2019 පෙබරවාරි මාසයේදී ගෙවා තිබුණි. පරිසර බලපෑම් ඇගයීමේ කාර්යය සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 27 දින කාර්මික තාක්ෂණික ආයතනය විසින් තාක්ෂණික යෝජනාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. මෙම

යෝජනාවේ ඇතුලත් වාර්තා කිරීමේ කාල රාමුවට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිනයේ සිට දින 14 ක් ඇතුලත ප්‍රාරම්භක වාර්තාවක්ද, දින 49 ක් තුල අතුරු වාර්තාවක්ද, දින 75 ක් තුල අවසන් කෙටුම්පත් වාර්තාවද , එම වාර්තාවට අදහස් දැක්වීමෙන් පසු දින 10ක් තුල අවසන් බලපෑම් ඇගයීම් වාර්තාවද ඉදිරිපත් කිරීම සඳහා සැලසුම් කර තිබුණද , 2020 ජුනි 30 දින වනවිටත් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා කාර්මික තාක්ෂණික ආයතනය අතර ලිඛිත ගිවිසුමකට ඇතුළත්ව නොතිබුණි.

(ආ) 2017 නොවැම්බර් 08 පැවති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය කමිටු රැස්වීමේදී යෝජිත බිංගිරිය අපනයන සැකසුම් කලාපය පිහිටුවීමට තීරණය කිරීමෙන් පසු අදාල ව්‍යාපෘතිය පිළිබඳ කඩිනමින් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්වරයා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත දැනුම්දී තිබුණි. ඒ අනුව එම කාර්යය පිළිවෙළින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලය වෙත පවරා තිබුණද සමාජීය හා පාරිසරික ශක්‍යතාව ප්‍රමාණවත් පරිදි අධ්‍යයනය කිරීමට එම ආයතනවලට පවතින නොහැකියාව මත අදාල කාර්යය කාර්මික තාක්ෂණ ආයතනය වෙත පැවරීමට ආයෝජන මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ සඳහා එම ආයතනය රු.4,905,063ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර මණ්ඩලය රු.4,265,272ක මුදලකට අදාල කාර්යය කාර්මික තාක්ෂණ ආයතනය වෙත භාරදී තිබුණි. අදාල වාර්තාව 2018 අගෝස්තු 27 දින සිට දින 75ක් තුල ඉදිරිපත් කලයුතු වුවත්, කාර්මික තාක්ෂණ ආයතනය විසින් 2019 සැප්තැම්බර් 06 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත වාර්තාව ඉදිරිපත්කර තිබුණු අතර මාස 09කට ආසන්න ප්‍රමාදයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, ඉහත ආයතනය තෝරාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

කාර්මික තාක්ෂණික ආයතනය සමග පරිසර බලපෑම් අධ්‍යයන වාර්තාව පිළියෙල කිරීම සඳහා ගිවිසුම අනුව එකඟ වූ වටිනාකම රු.4,180,000 ක් වුවද (රු.4,265,272 + NBT) පිරිසිදු කරන ලද අපජලය කරබලාන් ඔය ඔස්සේ මුදාහැරීම ප්‍රායෝගික නොවීම හේතුවෙන් සුදුසු මුදාහැරීමේ ක්‍රමවේදයක් පිළිබඳ අධ්‍යයනය කිරීම සහ යෝජිත ව්‍යාපෘති වර්ගවලට අතිරේකව නව යෝජනාවක් ලෙස ඉදිරිපත්වූ ඖෂධ ව්‍යාපෘතියේ අපජලය කළමනාකරණය සහ විෂ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඇගයීම යන කාර්යයන් හේතුවෙන් අධ්‍යයනයේ විෂය පථය පුළුල්වීම මත පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාව පිළියෙල කිරීම සඳහා මූලික ව්‍යාපෘති යෝජනාවේ සඳහන් ඇස්තමේන්තුගත පිරිවැයට අතිරේකව රු.1,652,500ක අතිරේක පිරිවැයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැරීමට සිදුව තිබුණි. විස්තර පහත දැක්වේ.

| පිරිවැය සංරචකය | මූලික ව්‍යාපෘති යෝජනාවේ සඳහන් ඇස්තමේන්තුගත පිරිවැය<br>රු. | සත්‍ය පිරිවැය<br>රු. | අතිරේක පිරිවැය<br>රු. |
|---|---|---|---|
| ජල තත්ව විශ්ලේෂණය | 300,000 | 750,000 | 450,000 |
| 24 hr Noise Measurement | 160,000 | 200,000 | 40,000 |
| Short Point Noise Measurement | - | 37,500 | 37,500 |
| 1 hr Vibration Measurement | 50,000 | 100,000 | 50,000 |
| ජල තත්ව විශේෂඥ පිරිවැය | 200,000 | 500,000 | 300,000 |
| වායු තත්ව විශේෂඥ පිරිවැය | 200,000 | 375,000 | 50,000 |
| සමාජ විද්‍යා විශේෂඥ පිරිවැය | 200,000 | 437,500 | 50,000 |
| ඝන සහ විෂ අපද්‍රව්‍ය විශේෂඥ පිරිවැය | - | 375,000 | 375,000 |
| සභය කාර්යය මණ්ඩල පිරිවැය | 150,000 | 300,000 | 150,000 |
| පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාවේ මුද්‍රණ පිරිවැය | - | 150,000 | 150,000 |
| **මුළු අතිරේක පිරිවැය** | | | **1,652,500** |

ඉහත සඳහන් මුදලින් රු.1,051,500ක මුදලක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කාර්මික තාක්ෂණික ආයතනය වෙත ගෙවා තිබුණි.

සැලසුම් කිරීමේ දුර්වලතා මෙම තත්ත්වයන් ඇතිවීමට හේතුවී තිබුණු බව නිරීක්ෂණයවිය.

## 3.3 නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම තුලින් වූ ආර්ථික බලපෑම

----------------------------------------------------------------------

යෝජිත අපනයන සැකසුම් කලාප ස්ථාපනය කිරීම ස්ථාපනය කිරීම සඳහා වූ 2017 දෙසැම්බර් 15 දිනැති අංක 17/2955/752/042 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් පහත සඳහන් සමස්ත ඉලක්ක 2020 වර්ෂයේදී ලගාකර ගැනීමට සංවර්ධන උපාය මාර්ගයන් හඳුනාගෙන ඇත.

(i) වසරකට ඇ.ඩො.බිලියන 5ක ඍජු විදේශ ආයෝජන

(ii) රැකියා - නව රැකියා 1,000,000

(iii) ආදායම - ඇ.ඩො.6000ක ඒක පුද්ගලික දළ දේශීය නිෂ්පාදනයක්

(iv) අපනයන - ඇ.ඩො.බිලියන 20ක්

(v) රජයේ ආදායම - දළ දේශීය නිෂ්පාදනයෙන් 15%ක්

එසේම 2018 සැප්තැම්බර් 04 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව 2017 වර්ෂයේ සිට වසර 06ක් ඇතුලත ඉඩම් සංවර්ධන කටයුතු අවසන් කිරීමත්, ඒ හරහා 2021, 2022 සහ 2023 වර්ෂවලදී රු.බිලියන 01 බැගින්ද, 2024 දී රු.බිලියන 2ක්ද, 2025දී රු.බිලියන 04ක්ද, 2026 සහ 2027 වර්ෂවල රු.බිලියන 06ක් සහ 2031 දක්වා රු.බිලියන 8ක් වූ ආනයන ඉක්ම වූ අපනයන ඉලක්කයක් අපේක්ෂා කර තිබුණි.

කෙසේ වෙතත් 2018 වර්ෂය වනවිට අදාල ඉඩම් අත්පත්කර ගැනීමේ කාර්යය අවසන් කල යුතුව තිබුණද, 2020 ජුනි 30 දින වනවිටත් අදාල ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය ඉටුකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් යෝජිත මිල්ලනිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීමේ කටයුතු නතරවී තිබුණි. එසේම බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීමේදී මහාමාර්ග ඉදිකිරීම, විදුලිය සැපයීම සහ ජල සම්පාදන කටයුතු වැනි යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සැලසුම් කරන ලද කාල රාමුව තුල ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව ඉහත සඳහන් පරිදි ශ්‍රී ලංකා රජය විසින් ලඟාකර ගැනීමට සැලසුම් කර තිබුණු ආර්ථික ප්‍රතිලාභ සැලසුම් කල කාල රාමුව තුල ලගාකර ගැනීමට නොහැකි වන තත්ත්වයක් නිරීක්ෂණය විය.

## 4. නිර්දේශ

4.1 ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සියළු අංශ කෙරෙහි අවධානය යොමු කරමින් නිසිපරිදි සැලසුම් කිරීම

4.2 පිරිවැය ඇස්තමේන්තු හා පුරෝකථනයන් තාත්වික පදනමකින් සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමු කරමින් වඩාත් නිවැරදිව සකස් කිරීම

4.3 ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයන වලදී අනාගත අවදානම් සහ අභියෝග සහිත ක්ෂේත්‍රයන් කෙරෙහි නිසි අවධානය යොමුකිරීම

4.4 ඉඩම් අත් පත් කර ගැනීමෙන් පසුව පමණක් යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම

4.5 යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පෙර අදාල ආයතන සමග විධිමත් ලිඛිත ගිවිසුම්වලට එළඹීම

4.6 යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් වෙනත් ආයතනවලින් ලබාගන්නා පිරිවැය ඇස්තමේන්තුවල නිරවද්‍යතාවය සහ ආර්ථික බව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම

4.7 යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අනුමත කරන ලද ප්‍රමාණ බිල්පත්‍ර රහිතව සහ ලිඛිත ගිවිසුම්වලට එළඹීමට ප්‍රථම වැඩ ආරම්භ කිරීමට අවසර නොදීම

4.8 යටිතල පහසුකම් හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීමේදී රජයේ අරමුදල්වල ආර්ථිකභාවය, කාර්යක්ෂමභාවය සහ ඵලදායීබව ආරක්ෂාවන පරිදි අඛණ්ඩව අධීක්ෂණය කිරීම

4.9 ගිවිසුම්ගත සේවා සැපයීමේ ගිවිසුම්වලදී අතිරේක පිරිවැයක් දැරීමට සිදුනොවන ආකාරයෙන් සහ සැලසුම්කළ කාලරාමුව තුළ කාර්යයන් ඉටුකර ගැනීමට හැකිවන පරිදි වාසි සහගත කොන්දේසි ඇතුළත් කිරීම.

ඩබ්ලිව්.පී සී. වික්‍රමරත්න

විගණකාධිපති

2020 දෙසැම්බර් 22දින